

දඹදිව බරණැස මිගදායේදී ගෞතම බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට ධර්මය දේශනා කළ අයුරු

## ꙰ සදහම් හඬින් තිලොවම පුබුදු කළ ඇසළ පොහොය අදයි

– කරව්වේ විජයතිස්ස නා හිමි

ඇසළ පෝද සිදු වූ ඓතිහාසික ශාසනික සිදුවීම් කිහිපයක් පිළිබඳ විස්තර ඇතුළත් ලිපියකි. බුදුරදුන්ගේ මංගල දම් දෙසුම, මාතෘ දිව්‍ය පුත්‍රයාට දම් දෙසීම, වස් සමාදන්වීම, රුවන්මැලි මහ සෑයේ ඉදිකිරීම් ආරම්භ කිරීම, සිරි දළදා පෙරහර පැවැත්වීම ආදී ඇසළ උත්සව හා සිදුවීම් මෙයට ඇතුළත්ය.

## ꙰ අනිත්‍ය – දුක්ඛ – අනාත්ම ලක්ෂණ හා සත්වයා අතර සම්බන්ධතාව

– ගලගෙදර රතනවංස හිමි

'සංස්කාර' නමින් බුදු දහමෙහි හැඳින්වෙන නිවනට අයත් නොවන – සියලු ලෝක ධර්ම තුළ ප්‍රකට වන ලක්ෂණ තුනක් හැටියට පෙන්වා දී ඇති අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය සත්වයා විෂයෙහි බලපවත්වන ආකාරයයි, මෙම ලිපියෙන් විග්‍රහ කැරෙන්නේ.

## ꙰ සදහම් දැනුම

– වහුමුවේ විජයවංස නා හිමි

බුද්ධ දහම සහ ඊට අදාළ විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන සේ දහම් කරුණු ඉදිරිපත් කැරෙන විශේෂාංගයකි. කෙටි ප්‍රශ්න හා පිළිතුරු ඇතුළත් මෙම විශේෂාංගය – දහම හදාරන සිසුන්ට විශේෂයෙන් ප්‍රයෝජනවත් එකක් ලෙස සැලකිය හැකි ය.

## ꙰ සැලැස්මක් නැත්නම් සංවර්ධනයක් නෑ

– ආචාර්ය මැදගම වජිරඥාණ නා හිමි

බටහිර සංස්කෘතික බලපෑම් වලට යටත් වීමේ ආදීනව. බටහිර සංස්කෘතික හා ආර්ථික ක්‍රමවල ආධිපත්‍යයෙන් මිදී – රටට ගැල–පෙන ආර්ථික හා සංස්කෘතික ප්‍රගතියක් බිහිකරන සැලසුම් සකස් කිරීමේ කාලීන අවශ්‍යතාව.

## ꙰ තානාපතිවරයකු ලෙස ඓතිහාසික මෙහෙවරක් ඉටුකළ අරිට්ඨ කුමරු

– ආචාර්ය බෙලිගල්ලේ ධම්මජෝති හිමි

දේවානම් පියතිස්ස රජුගේ විධිමත් රාජ්‍යාභිෂේකයට පෙර – ඒ පිළිබඳ පණිවිඩය දන්වා භාරතයේ එවකට බුදු දහමේ ආභාෂය ලබාගෙන සිටි අශෝක අධිරාජයා වෙත යැවූ දේවානම් පියතිස්ස රජුගේ බෑණනුවන් හා ප්‍රධාන ඇමැතිවරයා වූ අරිට්ඨ කුමරුගේ ඓතිහාසික තානාපති මෙහෙවර පිළිබඳ විමර්ශනයකි.

## ꙰ ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය යළි පිහිට වූ සියම් උපසම්පදාව

– ආචාර්ය හගුරන්කෙත ධීරානන්ද හිමි

විදේශ ආක්‍රමණ හා අන්‍යාගමික බලපෑම් ආදිය නිසා දහ අටවැනි සියවසේ මැද භාගය වන විට ශ්‍රී ලංකාවෙන් ගිලිහී ගිය ථෙරවාදී පැවිදි උපසම්පදාව; රාජ්‍ය වර්ෂ 1753 දී පමණ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගේ දැඩි උත්සාහය මත සියම් දේශයෙන් උපසම්–පන්න භික්ෂූන් වැඩම කරවා නැවත ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමේ ඓතිහාසික සිදුවීම පිළිබඳ විමර්ශනයකි.

## ꙰ බුදුරුවට නිගරු වන භාණ්ඩ ආනයනයට වැට බැඳේ?

– කතුවැකිය

## ꙰ ගී පද වැලක දැවටුණු බෞද්ධ තේමා

– නිර්මලා අමරසිංහ

මෑත කාලීන ගීත සාහිත්‍යයට බුදු දහමෙන් හා බෞද්ධ සංස්කෘති–යෙන් ඇති වූ බලපෑම. වත්මන් ඇතැම් බෞද්ධ ගීත පදමාලා තුළ දැක්වෙන දර්ශනික සංස්කෘතික අගය.

### සුරාව පිටු දකිමු

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

‘සුරාව’ නිසා සිදු වන සමාජ පරිහානිය සහ ‘සුරාව’ පිටුදැකීමේ කාලීන අවශ්‍යතාව. ‘ධම්ම චින්තා’ විශේෂාංගය යටතේ සාකච්ඡා කොට පළ කැරෙන කුඩා ලිපියකි.

### ශික්ෂාකාමී භික්ෂූන් අතර ප්‍රමුඛයා වූ රාහුල තෙරණුවෝ

– ගයාන් චානක විදානපතිරණ

සිදුහත් බෝධිසත්වයන් වහන්සේට දාව යශෝදරා දේවියගේ කුසින් උපත ලද රාහුල කුමරුගේ සුවිශේෂ චරිතය පිළිබඳ විමර්ශනයකි. පසුව බුදුරදුන් වෙතින් පැවිද්ද ලද රාහුල තෙරණුවන් තුළ තිබූ සුවිශේෂ ගුණ සම්භාරයද, උන්වහන්සේ ඒ තත්ත්වයට පත්වීම සඳහා සසර පෙරුම් දම් පිරූ අයුරු ද මෙම ලිපියෙන් විමසුමට ලක් කැරේ.

### පිරුවානා පොත් වහන්සේගේ අන්තර්ගතය පිළිබඳ විමැසුමක්

– එච්.ජී. පියසේන

‘පිරුවානා පොත් වහන්සේ’ නමින් ප්‍රකට මහ පිරිත් පොතෙහි ඇතුළත් විවිධ පිරිත් සූත්‍ර දේශනා පිළිබඳ විමර්ශනයකි. කොටස් වශයෙන් පළ වූ ලිපි පෙළක අවසන් කොටසයි, මෙවර පළවන්නේ.

### ලෝකය සහ ලෝක නිරෝධය හෙළි කරන මිගදායේ දේශනාව

–අමුගොඩ සෝමානන්ද හිමි

සමස්ත බුද්ධ දේශනාවේ හරය සංග්‍රහ වී ඇතැ’යි සැලකෙන ආර්ය සත්‍ය සතර ඇතුළත් බුදුරදුන්ගේ පළමු දම් දෙසුමට අර්ථ කථනයක් ලෙස – මෙම ලිපිය සැලකිය හැකි ය. සසර පැවැත්මේ යථා ස්වභාවය සහ එය නිරුද්ධ කිරීමට අදාළ ප්‍රතිපද මාර්ගයයි, මෙම සූත්‍රයෙන් බුදුරදුන් ඉදිරිපත් කොට ඇත්තේ.

### මල්වතු විහාර පාර්ශ්වයේ මහානායක පදවියට පත් තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නා හිමි

– කේ. බණ්ඩාරනායක

අභිනව මල්වතු මහ නාහිමියන්ගේ පදවි ප්‍රාප්තිය නිමිත්තෙන් පළවන උන්වහන්සේගේ ගුණ – නැණ – කුසලතා පිළිබඳ විස්තර ඇතුළත් විශේෂ ලිපියකි.

### පැවිදි වෙතොත් අධ්‍යාපනය තායිලන්තයේදී

ශ්‍රී ලංකාවේදී හෝ තායිලන්තයේදී අලුතෙන් පැවිදි වන අයට – තායිලන්තයේදී අධ්‍යාපන පහසුකම් සලසන ශිෂ්‍යත්ව පිරිනැමීමක් පිළිබඳ විස්තර ඇතුළත් ප්‍රවෘත්ති වාර්තාවකි.

### Kancanaskandha Jataka

*-By Dr.S.G. Samarasinghe Of Samskrti Research e-mail sgsa@slnet.lk*

### බෞද්ධ පුරුෂාර්ථ පහළ කරන සන්තානයක නිර්මලත්වය

– රෙජී වීරමන්

බුදු දහමෙන් අපේක්ෂිත ජීවන පරමාර්ථ කරා ළඟා වීමේදී – පුද්ගලයකු තුළ පහළ වන සන්තානගත පවිත්‍රතාව – නිවැරැදි දැක්මක් සහිතව නිවන් මඟට බැස ගැනීමේ අතුරු ඵල වශයෙන් බිහි වන සමාජ සදාචාරාත්මක ප්‍රගතිය.

### කැනඩාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට බෞද්ධ දර්ශනයෙන් ආලෝකය

– ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි

කැනඩාවේ බ්‍රිටිස් කොළොම්බියා ප්‍රාන්තය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයට බෞද්ධ දර්ශනයේ ආභාෂය ලබා දීම සඳහා වෙහෙස වන හිමි නමක් සමග එහි සිදු කැරෙන වත්මන් ශාසනික සේවා පිළිබඳ සාකච්ඡා කොට සකස් කැරුණු විශේෂ ලිපියකි.

### ඓතිහාසික රිදී විහාරය

– දර්ශී කලුබෝවිල

දුටුගැමුණු රජතුමා විසින් ඉදි කරවන ලදැ’යි සැලකෙන – සුප්‍රකට ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු කියැවෙන ලිපියකි. කුරුණෑගල සිට රිදීගම හරහා රම්බඩගල්ලට පිවිසෙන මාර්ගයෙහි ගමන් කරන අතරතුර මෙම විහාරයට පිවිසෙන මාර්ගය හමු වන බව ලේඛකයා පවසයි.

### බුදු සමය අනුමත කරන ධනාත්මක චින්තනය

– ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි

මිනිසා සතු සහජ ශක්තීන්ගෙන් උපරිම ජීවිත ඵලය ලබාගැනීම සඳහා දේශිත බෞද්ධ ප්‍රතිපද මාර්ගය තුළ ප්‍රකට වන ධන (ප්‍රගතිශීලී) ආකල්ප. අකුසලය පරදවා කුසලය වැඩීම සඳහා මිනිසා තුළ ඇති ශක්‍යතාව මතු කර පෙන් වූ බුදුසමයෙහි ඇතුළත් යථාර්ථවාදී ධන චින්තනය.

### අරන්කැලේ වනවාසාරාමය

– ජනක වෙත්තසිංහ

කුරුණෑගල සිට දඹුල්ල බලා දිවෙන මාර්ගයේ ඉබ්බාගමුවෙන් වමට ඇති මඩගල්ල පාරට හැරී සැතපුම් කීපයක් ගමන් කළ විට හමු වන ඉපැරණි සුප්‍රකට ආරණ්‍ය සේනාසනයක් පිළිබඳ තොරතුරු. ශ්‍රී ලංකාවේ වැඩ සිටි රහතන් වහන්සේ නමක් ලෙස ප්‍රකට ‘මලියදේව හිමියන්’ විසූ ආරණ්‍යයක් ලෙස ද මෙය සැලකේ.

### වැසුණු ගින්නෙන් පිළිස්සෙන මිනිස්සු

– දිවියාගහ යසස්සි නා හිමි

යහපත් හෝ අයහපත් චේතනා අනුව සිදු කරන ලද කර්මවල ප්‍රතිවිපාක ලැබෙන අයුරු ද ජීවන ප්‍රගතිය හා ආධ්‍යාත්මික දියුණුව අපේක්ෂා කරන අය තමන්ගේ කර්ම ශක්තිය පිළිබඳ සැලකිලිමත් විය යුතු අයුරුද පැහැදිලි කැරෙන කුඩා ලිපියකි.
“සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්” විශේෂාංගය යටතේ මෙම ලිපිය පළවේ.